# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2406/33 – 2024 ඔක්තෝබර් මස 20 වැනි ඉරිදා – 2024.10.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

### වන්දනා ගමන් ආඥාපනත

අම්මඩුව, කුඩා කතරගම දේවාලයේ ඇසළ පෙරහැර උත්සවය - 2024

2024 වසරේ අම්මඩුව කුඩා කතරගම දේවාලයේ ඇසළ පෙරහැර මංගල්‍යය ඔක්තෝබර් මස 23 වන දින සුභ මොහොතින් ආරම්භ කෙරේ.

- ඔක්තෝබර් මස 23 වන දින සඝ සතු දානමය පිංකම හා සර්ව රාත්‍රික පිරිත් දේශනාව
- ඔක්තෝබර් මස 25 වන දින සවස 7.30 ට සුභ මොහොතින් කප් සිටුවීම
- ඔක්තෝබර් මස 25 වන දින සිට 29 දින දක්වා කුඹල් පෙරහැර
- ඔක්තෝබර් මස 30 වන දින සිට නොවැම්බර් මස 03 දින දක්වා දෙවේලේ පෙරහැර
- නොවැම්බර් මස 04 වන දින සිට නොවැම්බර් මස 08 දින දක්වා රන්දෝලි මහ පෙරහැර
- නොවැම්බර් මස 09 වන දින උදෑසන ඓතිහාසික දිය බෝල පොකුණේදී දිය කැපීමෙන් ඇසළ පෙරහැර නිමාවට පත් වේ.

2. දේවාලයේ උතුරට දේවාලයේ පිටුපස මුකලාන ද, දකුණට රංචල අම්මඩුව පාර ද, නැගෙනහිරට දේවගිරි කපු මහතාගේ ඉඩම ද, බස්නාහිරින් නිලමේ මහතාගේ ඉඩම ද සීමාවේ.

3. ආසාදන රෝගයකින් හෝ ස්පර්ශක රෝගයකින් පෙළෙන හෝ පෙළෙන්නේ යැයි තමා දන්නා කිසිම තැනැත්තකුට කඳවුරු පෙදෙස ඇතුළත යම් බේකරියක්, කැවිලිහලක් හෝ කැවිලි සාදන ස්ථානයක්, භෝජනාගාරයක් හෝ දන්සලක් තත්කාලයේ භාරව සිටින යම් තැනැත්තකු විසින් අවස්ථාවෝචිත පරිදි ඒ බේකරියට, කැවිළිහලට හෝ කැවිලි සාදන ස්ථානයට, භෝජනාගාරයට හෝ දන්සලට ඇතුළු වීමට හෝ යම් ද්‍රව්‍යයක් ආහාර පාන බෙදා හැරීමේ දී, විකිණීමේ දී හෝ නිෂ්පාදනය කිරීමේ දී සහභාගී වීමට බලය නැත.

4. දිසාපතිවරයාගේ ලිඛිත අවසරය නොමැතිව කිසිම තැනැත්තෙකු විසින් කිසිම ගවයෙක් හෝ වෙනත් යම් සතෙකු කඳවුරු පෙදෙස තුළට ගෙන ඒම නොකළ යුතුය.

5. කඳවුරු පෙදෙස තුළට හෝ කඳවුරු පෙදෙසෙන් පිටතට හෝ කඳවුරු පෙදෙස ඇතුලත හෝ වාහන ගමනාගමනය හෝ පයින් ගමන් කිරීම තහනම්, එසේ වුවද 7 වැනි නියෝගය යටතේ කරත්ත හා ගොනුන් නවතා තැබීම සහ වෙන් කරනු ලැබ ඇති ස්ථානයක් කරා කරත්ත ගෙන යාම ගොනුන් දක්කාගෙන යාම සම්බන්ධයෙන් මෙම නියෝග අදාල නොවන්නේය.

6. කඳවුරු පෙදෙස තුල පිහිටි සියලු බේකරි හා කැවිලි හල්, කැවිලි සාදන ස්ථාන, භෝජනාගාර දන්සල් යන වෙළඳ ව්‍යාපාරික කාර්යයන් සඳහා පාවිච්චි කරනු ලබන ගොඩනැගිලි හෝ ඉදි කිරීම් සඳහා ඝණ මීටර් 1% ට (ඝණ අඩි 4%) නො අඩු ධාරිතාවක් ඇති දැවමය හෝ ලෝහමය කසළ බඳුනක් සපයනු ලැබිය යුතු අතර එකී කසළ බඳුන ඉවත් කරනු ලබන විට හෝ හැර සෑම අවස්ථාවක දීම දැවමය හෝ ලෝහමය පියනකින් වසා තැබිය යුතුය.

7. තේ අපද්‍රව්‍ය, කෝපි අපද්‍රව්‍ය. කිරි අපද්‍රව්‍ය හෝ යම් ආහාරයක හෝ පානයක ඉතිරි කොටස් හෝ පිසීමේ දී ඉවතලන ද්‍රව්‍ය හෝ වෙනත් ඉවතලන ද්‍රව්‍ය කිසිවක් කඳවුරු පෙදෙස තුල කිසිම ස්ථානයක බිමට විසි කරනු නොලැබිය යුතුය. එවැනි සියලු අපද්‍රව්‍ය ඉතිරි කොටස් හෝ ඉවතලන ද්‍රව්‍ය 19 වන නියෝගයේ විධිවිධාන සලසා ඇති ආකාරයට තබා ඇති භාජනයකට දැමිය යුතුය. එසේම ඉවතලන අපද්‍රව්‍ය කඳවුරු පෙදෙස ඇතුලත යම් ස්ථානයක බිමෙහි හෝ ඒ අසල පොළොවෙහි විසි කොට තිබෙන බවට පෙනී ගිය හොත් ඒ ස්ථානයේ අයිතිකරු, ප්‍රධාන මුරකරු හෝ ස්ථානයේ බලපත්‍රධාරියා විසින් එම වරද සිදු වීම වැලැක්වීමට අවශ්‍ය සියලු පූර්වෝපායන් නොයෙදූ බව සහ නොසැලකිල්ලෙන් ක්‍රියාකල බව ඔප්පු කරනු ලැබුවහොත් එහි අයිතිකරුගේ ප්‍රධාන පදිංචිකරු හෝ එකී බලධාරියා මේ නියෝගයේ විධි විධාන කඩ කර ඇති ලෙස සලකනු ලැබේ.

8. දිස්ත්‍රික් ලේකම්වරයාගේ මතය අනුව මෙම නියෝගවල 15 වැනි 16 වැනි 17 වැනි 18 වැනි හෝ 19 වැනි නියෝගය කඩ කරමින් පිහිටුවනු ලැබ ඇත්තා වූ ද පවත්වාගෙන යනු ලබන්නා වූද කඳවුරු පෙදෙස තුළ පිහිටියා වූ ද යම් බේකරියක්, කැවිලිහලක් හෝ කැවිලි සාදන ස්ථානයක් භෝජනාගාරයක් දන්සලක් හෝ යම් වෙළඳ ව්‍යාපාරික ස්ථානයක් වසා දැමීමට නියම කිරීම හා ඒ ස්ථානය වෙනුවෙන් යම් බලපත්‍රයක් නිකුත් කරනු ලැබ තිබේ නම් එකී බලපත්‍ර වහාම අවලංගු කිරීමට බලය ඇත.

9. කඳවුරු පෙදෙස තුල යම් ආසාදනයකින් පෙළෙන පුද්ගලයන් සිටිනවා නම් අන් පුද්ගලයන් ඇසුරු නොකළ යුතුය. එසේ සිටින බව අනාවරණය වුවහොත් පොලිස් නිලධාරියෙකුට හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාට දැන්විය යුතුය.

10. යම් ආසාදනයකින් පෙළෙන පුද්ගලයෙක් වෙතොත් එම පුද්ගලයාට ආහාර අලෙවිසැල් වලට ඇතුලු වීමට හෝ ආහාර සැල්වල ආහාර පිසීමට හෝ විකිණීමට ඉඩ නොදිය යුතුය.

11. පෙරහැර භූමිය තුළ ඇති ආහාර අලෙවිසැල්වල යම් ආසාධිත පුද්ගලයන්ට නවාතැන් නොදිය යුතුය. එසේ සිටින බව දැනගත් විගස පොලිසියට හෝ මහජන සෞඛ්‍ය නිලධාරියාට ඒ බව දැන්වීය යුතුය.

12. 7 වැනි නියෝගය යටතේ සිඟමන් යැදීම සහ පිනට ඉල්ලා ගැනීම සඳහා වෙන් කරනු ලැබ ඇති හෝ සපයනු ලැබ ඇති යම් ස්ථානයක දී හැර කඳවුරු පෙදෙස තුළ මුදලක් හෝ යම් වෙනත් ආකාරයකින් හෝ කිසිම තැනැත්තෙකු විසින් පිනට දීම හෝ පිනට යමක් බෙදා හැරීම හෝ නොකළ යුතුය.

13. 7 වැනි නියෝගය හෝ 10 වැනි නියෝගය යටතේ යම් ස්ථානයක ප්‍රදර්ශනය කරනු ලැබ ඇති යම් දැන්වීමක් හෝ නාම පුවරුවක් කිසිම තැනැත්තෙකු විසින් අයුතු ලෙස වෙනස් කිරීම හෝ ඉවත් කිරීම නොකළ යුතුය.

14. දිස්ත්‍රික් ලේකම්, වෛද්‍ය නිලධාරියා, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා හෝ යම් පොලිස් නිලධාරියෙකු විසින් (අ)මේ නියෝගය අතුරින් යම් නියෝගයක් හෝ ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා කඳවුරු පෙදෙස තුළ (ආ) 7 වැනි නියෝගය යටතේ යම් දැන්වීමක් හෝ නාම පුවරුවක් නම ප්‍රදර්ශනය කර තැබීමෙන් කාර්යය සඳහා කඳවුරු පෙදෙස තුළ යම් ඉඩමක හෝ ස්ථානයක යම් කණුවක් සිටුවීම හෝ ඉදි කිරීමක් ගොඩනැගීම නිත්‍යානුකුල වන්නේය.

**අනුරාධ ජයකොඩි,**
ප්‍රාදේශීය ලේකම්,
වැලිගෙපොල.

EOG 10 - 0156

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.